සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

**මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மத்திய மாகாண கல்வித் திணைக்களம்**
**Department of Education Central Province**

8202

**08 ශ්‍රේණිය** | තෙවන වාර පරීක්ෂණය - 2023(2024) | **32 S I,II**

නම: ........................................... | **ගණිතය** | **කාලය පැය දෙකයි**


• ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

01. අගය සොයන්න. $(-5) \times (-4)$

02. සුළු කරන්න.

$\frac{3}{4} \times \frac{2}{9}$

03. $x$ හි අගය සොයන්න.




04. $484 = 2 \times 2 \times 11 \times 11$ නම් $\sqrt{484}$ හි අගය සොයන්න.


05. $253 \div 10 = 25.3$ නම් $25.3 \div 100$ හි අගය ලියන්න. .

06. ගබඩාවක ඇති වී 29 t 900 kg ස්කන්ධයක් සමාන ප්‍රමාණ ඇතුළත් වන සේ ලොරි දහතුනකට අසුරනු ලැබේ. එම එක් ලොරියකට පටවන ලද වී ප්‍රමාණයේ ස්කන්ධය සොයන්න.

07. දී ඇති වීජීය ප්‍රකාශනය සාධක දෙකක ගුණිතයක් ලෙස ලියා ඇත. හිස්තැන් සම්පූර්ණ කරන්න.

$5x - 10y + \square = 5(x - \square + 5)$

08. $x$ හි අගය සොයන්න.




09. $\frac{y}{4} = 3$ සමීකරණය විසඳන්න.


10. $A = \{a, e, i, o, u\}$ නම් පහත සඳහන් හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු යා කරන්න.

| | | |
|---|---|---|
| i. | n (A) | $\in$ |
| ii. | a ....... A | $\notin$ |
| iii | $x$ ........ A | 5 |

11. $\frac{3}{20}$ ප්‍රතිශතයක් ලෙස ලියන්න.

12. පාසලක සිසුන් 1450 සිටී. ගැහැණු ළමුන්ගේ ප්‍රතිශතය 60 % ක් නම් පාසලේ සිටින ගැහැණු ළමුන් ගණන සොයන්න.

13. දී ඇති ත්‍රිකෝණයේ වර්ගඵලය සොයන්න.





14. පහත සඳහන් බල ආරෝහණ පිළිවෙලට සකස් කර ලියන්න.


$2^3, (-1)^{10}, (-10)^1, 3^2$

15. පහත දක්වා ඇති සෘජුකෝණාස්‍රය සම්බන්ධ ප්‍රකාශ හරි නම් "✓" ලකුණද වැරදි නම් "×" ලකුණ ද යොදන්න.

| | |
|---|---|
| ද්විපාර්ශ්වික සමමිතික අක්ෂ ගණන 4 කි. | |
| භ්‍රමක සමමිති ගණය 2 කි. | |
| මෙහි භ්‍රමණ කේන්ද්‍රය O වේ. | |




16. a හි අගය සොයන්න.





17. $x = (-3)$, $y = 2$ විට $x^2 - 2y + 1$ ප්‍රකාශනයේ අගය සොයන්න.

18. පහත දක්වා ඇති සංයුක්ත ඝන වස්තුවේ,

දාර ගණන = ........................

මුහුණත් ගණන = ........................

ශීර්ෂ ගණන = ........................ ලියන්න.



19. 1 : 20000 පරිමාණයට අඳින ලද සිතියමක 1 cm කින් දැක්වෙන සැබෑ දිග මීටර් වලින් සොයන්න.

20. 2 : 3 = ☐ : 9 = 18 : ☐ හිස්තැන් සම්පූර්ණ කරන්න.

## II කොටස

● ප්‍රශ්න හයකට පිළිතුරු සපයන්න.

(01) a. P = { 1 ත් 15 ත් අතර ඇති ඉරට්ට සංඛ්‍යා}

i. P කුලකයේ අවයව සඟල වරහන් තුළ ලියන්න.

ii. වෙන් රූප සටහනක P හි අවයව ලියා දක්වන්න.

b. බෑගයක කිරි රසැති ටොෆි 3 ක් ද දොඩම් රසැති ටොෆි 2 ක් ද සියඹලා රසැති ටොෆියක් ද ඇත.

i. කිරි රසැති ටොෆියක් ලැබීමේ සම්භාවිතාව සොයන්න.

ii. දොඩම් රසැති හෝ සියඹලා රසැති ටොෆියක් ලැබීමේ සම්භාවිතාව සොයන්න.

c. Q = { 1 ත් 10 ත් අතර 15 ගුණාකාර}

i. $n(Q)$ හි අගය ලියන්න.

ii. Q කුලකය හඳුන්වන විශේෂ නම කුමක් ද?

(02) a. රූපයේ දක්වෙන්නේ මිනුම් සහිත හිස් මාළු ටැංකියකි. පතුලේ දිග 50cm හා පළල 20 cm කි.


i. පතුලේ වර්ගඵලය සොයන්න.

ටැංකියේ උස 10cm නම්,

ii. ටැංකියේ පරිමාව සොයන්න.

$1\,ml = 1\,cm^3$ නම්

iii. ටැංකියේ ධාරිතාව ලීටර් කීයද?




b. 2023.10.20 දින +5 කාල කලාපයේ පිහිටි පකිස්ථානයේ කරච්චි නගරයේ වේලාව පෙ.ව. 9.00 වේ. එවිට -6 කාල කලාපයේ පිහිටි කැනඩාව රටේ අගනුවර වන ටොරොන්ටෝ නගරයේ වේලාව සොයන්න.

(03) 8 වන ශ්‍රේණියේ සිසුන් 15 දෙනෙකු ගණිතය විෂය සඳහා ලකුණු 50 න් දෙන ප්‍රශ්න පත්‍රයකට ලබාගත් ලකුණු පහත දක්වේ.

| | | | | |
|---|---|---|---|---|
| 12 | 34 | 08 | 14 | 50 |
| 22 | 25 | 43 | 27 | 26 |
| 18 | 40 | 39 | 43 | 43 |

i. මෙම දත්ත වෘන්තපත්‍ර සටහනකින් දක්වන්න.

ii. මෙම ලකුණු වල පරාසය සොයන්න.

iii. එකම ලකුණ ලැබූ සිසුන් කී දෙනෙකු සිටීද?


iv. එම ලකුණ හඳුන්වන විශේෂ නම ලියන්න.

v. සිසුවෙකු ලබාගත් ලකුණු වල මධ්‍යන්‍ය සොයන්න.

(04) a. රූපයේ XY හා AB සරල රේඛා D හි දී ඡේදනය වේ. CD, AB ට ලම්බව ඇඳ ඇත. මෙහි


i) ප්‍රතිමුඛ කෝණ යුගලයක් නම් කරන්න.

$X\hat{D}B = 100^0$ නම් $Y\hat{D}C$ හි අගය සොයන්න.




8198

b. දෙන ලද රූපයේ $x$ හා y හි අගය සොයන්න.




දී ඇති තොරතුරු අනුව a හා x හි අගයන් සොයන්න. හේතු දක්වන්න.




(05) a. i. x හා y අක්ෂ -4 සිට +4 තෙක් අංකනය කළ කාටීසීය තලයක් අඳින්න.

ii. එම කාටීසීය තලය මත පහත සඳහන් ලක්ෂ්‍ය ලකුණු කර පිළිවෙලින් යා කර සංවෘත්ත රූපයක් ලබාගන්න.

A = (-1, -3) B = (-2, 0) C = (-3, +1) D = (-1, 3)

E = (1 , 1) F = (0,0)

iii. එම රූපයේ සමමිතික අක්ෂය අඳින්න.

iv. එම රේඛාවේ සමීකරණය ලියන්න.

b. $-3 \leq x < 1$ අසමානතාව සංඛ්‍යා රේඛාවක නිරූපණය කරන්න.


(06) i. AB = 7cm ද BC = 4 cm ද AC = 9 cm ද වන ABC ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

ii. ABC ත්‍රිකෝණය පාද අනුව කුමන වර්ගයේ ත්‍රිකෝණයක් ද?

iii. මෙම ත්‍රිකෝණයේ විශාලම කෝණයේ අගය මැන ලියන්න.

iv. එම කෝණයේ අගය අනුව ABC කුමන වර්ගයේ ත්‍රිකෝණයක් ද?

(07) a. O කේන්ද්‍රය වූ වෘත්තය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
**මෙම රූපය ඔබේ උත්තර පත්‍රයේ පිටපත් කරගන්න.**




i. සුළු වෘත්ත ඛණ්ඩ කොටස අඳුරු කරන්න.

ii. POS රේඛාව හඳුන්වන විශේෂ නම කුමක් ද?

iii. කේන්ද්‍රික ඛණ්ඩ කෝණයේ නම ලියන්න.

b. තරිඳු තම යහළුවෙකු වූ නියාස්ගේ නිවසට යාමට උ 50° නැ දිශාව ඔස්සේ 200 m ගමන් කරයි. ඔවුන් දෙදෙනාගේ යහළුවෙකු වූ රාධාගේ නිවසට යාමට දෙදෙනාම කැමති විය. ඒ අනුව නියාස්ගේ නිවසේ සිට ද 80° නැ දිශාව ඔස්සේ 300 m ක් ගමන් කළ විට රාධාගේ නිවස හමුවිය.

i. මෙම තොරතුරු දළ සටහනකින් නිරූපණය කරන්න.

ii. තරිඳුගේ නිවසේ සිට රාධාගේ නිවස පිහිටා ඇති දිශාව ලියන්න.


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න